මහේස්ත්‍රාත් අධිකරණය
1988
අනුරාධපුරය

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 9 දරන
# මංමාවත් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 මාර්තු මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 මාර්තු මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
**ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක**

**මිල : රු. 1.50 යි** | **තැපැල් ගාස්තුව : රු. 1.15 යි**

# 1988 අංක 9 දරන මංමාවත් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 මාර්තු මස 25 වන දින]

එල්.ඩී.—ඕ. 24/85

මංමාවත් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1988 අංක 9 දරන මංමාවත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — කෙටි නාමය.

2. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 37 දරන පනතින් සංශෝධිත මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන, මංමාවත් ආඥාපනතේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— — 193 වන අධිකාරයේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"නිලධරයන් හා සේවකයන් පත් කිරීම සහ ඔවුන්ගේ බලතල ආදිය.

4. (1) මේ ආඥාපනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි සියලු නිලධරයන් සහ සේවකයන් පත් කරනු ලැබිය හැකි ය.

(2) එක් එක් ප්‍රදේශයේ ප්‍රධාන ඉංජිනේරුවරයා සහ එක් එක් කොට්ඨාසයේ විධායක ඉංජිනේරුවරයා අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව ස්වකීය ප්‍රදේශයේ හෝ කොට්ඨාසයේ මේ ආඥාපනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වග කිව යුතු ය.

(3) මේ ආඥාපනතෙහි—

(අ) "ප්‍රදේශය" යන්න ප්‍රධාන ඉංජිනේරුවරයාට අදාළව යොදනු ලැබූ විට ඔහු පත් කරනු ලැබ ඇති ප්‍රදේශය ඉන් අදහස් වේ.

(ආ) "කොට්ඨාසය" යන්න විධායක ඉංජිනේරුවරයාට අදාළව යොදනු ලැබූ විට ඔහු පත් කරනු ලැබ ඇති ප්‍රදේශය ඉන් අදහස් වේ.

(4) මේ ආඥාපනතින් ප්‍රධාන ඉංජිනේරුවරයා වෙත පවරා ඇති කවර හෝ කර්තව්‍යයක් අධ්‍යක්ෂවරයා විසින් ඉටු කිරීම නීත්‍යානුකූල වන අතර, මේ ආඥාපනතින් විධායක ඉංජිනේරුවරයා වෙත පවරා ඇති කවර හෝ කර්තව්‍යයක් ප්‍රධාන ඉංජිනේරුවරයා විසින් ඉටු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(5) ප්‍රධාන ඉංජිනේරුවරයා හෝ විධායක ඉංජිනේරුවරයා හෝ වෙත මේ ආඥාපනතින් පැවරී ඇති කවර හෝ කර්තව්‍යයක් ඉටු කිරීමට ප්‍රධාන ඉංජිනේරුවරයා හෝ විධායක ඉංජිනේරුවරයා හෝ නොවන දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත අධ්‍යක්ෂවරයා විසින්

2—ඒ 101436—7,285 (88/02)

ලියවිල්ලකින් බලයදීම නීත්‍යානුකූල වන අතර, ඒ නිලධරයා විසින් ඒ කර්තව්‍ය ඉටු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියෙහි " ආණ්ඩුව වෙනුවෙන් " යන වචන යෙදෙන කවර හෝ විටක ඒ වචන වෙනුවට " අධිකාරිය වෙනුවෙන් " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ, 7ආ, 7ඇ, සහ 7ඈ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එහි 7අ, 7ආ, 7ඇ සහ 7ඈ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය.

" එකඟවීමක බලය පිට පමණක් තැනැත්තන් විසින් පාරක් පාවිච්චි කළ යුතු බව.

7අ. යම් පොදු සේවාවක හෝ යම් පෞද්ගලික ව්‍යවසායක නැතහොත් අරමුණක කාර්යය සඳහා මේ ආඥාපනත අදාළවන පාරක් හෝ මංමාවතක් කිසිම තැනැත්තකු විසින් පාවිච්චි කිරීම හෝ එහි කිසියම් වැඩක් කිරීම හෝ කිසියම් පිරියතක් හෝ ඉදිකිරීමක් සවි කිරීම හෝ පවත්වා ගෙනයාම, 7 වන වගන්තියේ සඳහන් එකඟවීමක නියම හා කොන්දේසි යටතේ සහ නියම හා කොන්දේසි වලට අනුකූලව හැර නොකළ යුතුය :

එසේ වුවද, එවැනි යම් එකඟවීමක් ප්‍රකාර යම් පාරක් කැණීම, හෑරීම හෝ කැපීම ආරම්භ කිරීමට ඉඩ දීමට පෙර ඒ කැණීමෙන්, හෑරීමෙන් හෝ කැපීමෙන් පසුව ඒ පාර ප්‍රතිස්ථාපනය කිරීම, හෝ අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රධාන ඉංජිනේරුවරයා විසින් ඇස්තමේන්තු කරන ලද පරිදි වූ වියදම, ඒ ප්‍රතිස්ථාපන කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා ඇස්මේන්තු කරන ලද වියදමෙන් සියයට දහයක් වන අතිරේක තැන්පතුවක් ද සමග ප්‍රධාන ඉංජිනේරුවරයාට ගෙවිය යුතු ය ;

එසේම තවදුරටත් අතුරු විධානයේ සඳහන් අතිරේක තැන්පතුව ගෙවීමේ නියමය, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

තැනැත්තන් විසින් වළක් හෝ කාණුවක් ආපසු පිරවිය යුතු බව.

7ආ. 7 වන වගන්තිය යටතේ එකඟවීමකට එළඹ ඇත්තා වූ සහ පාරක් කණින, හාරන, කපන හෝ පාරකට හානි සිදුවන වෙනත් කිසිවක් කරන යම් තැනැත්තකු විසින්, ඒ කැණීම හෑරීම හෝ කැපීම අවශ්‍ය වූයේ යම් කාර්යයක් සඳහා ද, ඒ කාර්යය සම්පූර්ණ කළ වහාම සහ කවර හෝ විටක 7 වන වගන්තිය යටතේ වූ එකඟ වීමෙහි ඒ සම්බන්ධ යෙන් ශිවිසගෙන ඇති යම් කාලයක් පසු නොවී තමාගේ ඒ කැණීමෙන්, හෑරීමෙන් හෝ කැපීමෙන් ඇති වූ කාණුව හෝ වළ විධායක ඉංජිනේරුවරයා

විසින් අනුමත කරන පිරවුම් ද්‍රව්‍ය යොදා ගනිමින් විධායක ඉංජිනේරුවරයා විසින් නිශ්චිතව නියම කරන යම් සුසංහිත තට්ටුවලින්, විධායක ඉංජිනේරුවරයා විසින් පෙන්වා දෙනු ලැබූ මට්ටමකට ආපසු පිරවිය යුතු ය. එම ආපසු පිරවීම සතුටුදායක ලෙස සම්පූර්ණ කර ඇති බවට විධායක ඉංජිනේරුවරයා සෑහීමට පත්වූ විට, 7අ වගන්තියෙහි සඳහන් සියයට දහයක අතිරේක තැන්පත් මුදල සංවර්ධකයන්ට ආපසු ගෙවිය යුතු ය:

එසේ වුවද, ඒ එකඟවීමෙහි නිශ්චිත කාලය ඇතුළත එම ආපසු පිරවීම කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබුවහොත් හෝ විධායක ඉංජිනේරුවරයා විසින් විධාන කරනු ලැබූ ආකාරයට එම ආපසු පිරවීම සම්පූර්ණ කරනු නොලැබුවහොත් හෝ විධායක ඉංජිනේරුවරයා විසින් එම ආපසු පිරවීම සම්පූර්ණ කිරීම සැලැස්විය හැකි අතර, එම ආපසු පිරවීමේ වියදම 7අ වගන්තිය යටතේ තැන්පත් කරන ලද මුදලින් හිලව් කළ යුතු ය.

7අ වගන්තිය උල්ලංඝනය කිරීම වරදක් බව.

7ඇ. මේ ආඥාපනත අදාළ වන කිසියම් පාරක් හෝ මංමාවතක් 7අ වන වගන්තිය උල්ලංඝනය වන පරිදි ප්‍රයෝජනයට ගන්නා හෝ එහි කිසියම් වැඩක් කරන හෝ යම් පිරියතක් හෝ ඉදිකිරීමක් පවත්වා ගෙන යන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට යටත් වන්නේ ය.

බාධක නතර කිරීම.

7ඈ. 7 වන වගන්තියේ සඳහන් එකඟවීමක ඇතුළත් කිසිවක් හෝ යම් ලිඛිත නීතියක පටහැනිව ඇති කිසිවක් නොතකා 7 වන වගන්තියෙහි සඳහන් එකඟවීමක් ප්‍රකාර යම් පාරකට හෝ මංමාවතකට බාධකයක් කර ඇති යම් තැනැත්තකුට එම බාධකය තත් කාර්යය සඳහා නිශ්චිතව නියම කරනු ලැබිය හැකි යම් කාලයක් ඇතුළත විධායක ඉංජිනේරුවරයා සෑහීමට පත් වන පරිදි ඉවත් කරන ලෙස හෝ නතර කරන ලෙස විධායක ඉංජිනේරුවරයා විසින් දැන්වීමක් නිකුත් කිරීම නීත්‍යනුකූල වන අතර, ඒ කාලය ඇතුළත ඒ බාධකය ඉවත් කිරීම හෝ නතර කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබුවහොත් හෝ නොසලකා හරිනු ලැබුවහොත් නැත්නම් ඒ තැනැත්තා සොයා ගත නොහැකි වුවහොත්, විධායක ඉංජිනේරුවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් ඒ බාධකය

ඉවත් කර හෝ නතර කර, ඒ සම්බන්ධයෙන් දරන්නට සිදු වූ වියදම 33 වන වගන්තියෙහි විධි විධාන සලසා ඇති ආකාරයට අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය. එම ඉවත් කිරීම හෝ නතර කිරීම හේතුවෙන් ඇති වන, එම එකඟවීම කඩ කිරීමක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට කිසිම වන්දියක් ගෙවනු නොලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

(1) මේ උපවගන්තිය බලාත්මක වන දින සිට සහ ඉන් පසුව, කිසිම තැනැත්තකු විසින්—

(අ) කොට්ඨාසයේ විධායක ඉංජිනේරුවරයා විසින් දෙන ලද බලපත්‍රයක බලය යටතේ හැර (මෙහි මින් මතු "ගොඩනැගිලි සීමාව" යනුවෙන් සඳහන් කරනු ලබන)

(i) මහාමාර්ග දෙපාර්තමේන්තුව භාරයේ පවතින "අ" පන්තියේ පාරක් බවට, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අධ්‍යක්ෂවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද පාරක් සම්බන්ධයෙන් වන විට, එම පාර මධ්‍යයේ සිට මීටර් පසළොසක් වන,

(ii) මහාමාර්ග දෙපාර්තමේන්තුව භාරයේ පවතින "ආ" පන්තියේ පාරක් බවට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අධ්‍යක්ෂවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද පාරක් සම්බන්ධයෙන් වන විට, එම පාර මධ්‍යයේ සිට මීටර් දොළහක් වන,

(iii) මහාමාර්ග දෙපාර්තමේන්තුව භාරයේ පවතින "ඇ" පන්තියේ සහ "ඈ" පන්තියේ පාරක් බවට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අධ්‍යක්ෂවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද පාරක් සම්බන්ධයෙන් වන විට, එම පාර මධ්‍යයේ සිට මීටර් හතයි දශම පහක් වන

සීමාවක් ඇතුළත යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, දොරටු මඟක් හෝ වෙනත් යම් නිර්මාණයක් ඉදිකිරීම හෝ

යටි බිම් මහලක් නැතහොත් වෙනත් යටි බිම් නිර්මාණයක් තැනීම හෝ ළිඳක්, පොකුණක් නැතහොත් පතල් ළිඳක් කැණීම,

(ආ) කොට්ඨාසයේ විධායක ඉංජිනේරුවරයා විසින් දෙනලද බලපත්‍රයක බලය යටතේ හැර එවැනි යම් පාරක ගොඩනැගිලි සීමාව තුළ යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, දොරටු මගක් හෝ වෙනත් යම් නිර්මාණයක් හෝ යම් යටි බිම් මහලක් හෝ වෙනත් යටි බිම් නිර්මාණයක් හෝ යම් ළිඳක්, පොකුණක් හෝ පතල් ළිඳක් නැවත ඉදිකිරීම නැතහොත් ඒ යමකට කොටසක් එකතු කිරීම

නීත්‍යනුකූල නොවන්නේ ය :

එසේ වුවද, මේ උපවගන්තිය ක්‍රියාත්මක වන දිනයේ දී පැවති යම් ගොඩනැගිල්ලකට, මායිම් තාප්පයකට, දොරටු මගකට හෝ වෙනත් යම් නිර්මාණයකට හෝ යම් යටි බිම් මහලකට හෝ වෙනත් යටි බිම් නිර්මාණයකට හෝ යම් ළිඳකට, පොකුණකට හෝ පතල් ළිඳකට කරනු ලබන මේ උපවගන්තිය ක්‍රියාත්මක වීමට පෙරාතුව බලපත්‍රයක් අවශ්‍ය වූ යම් ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ දොරටු මගක අලුත්වැඩියාවක් නොවන, අලුත්වැඩියාවක් කෙරෙහි මේ උපවගන්තියේ ඉහතින් ඒ විධිවිධානවල කිසිවක් අදාළ වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ දොරටු මග" හෝ "ගොඩනැගිල්ල, තාප්පය හෝ ගේට්ටුව" යන යෙදුම හෝ ඒවායේ ව්‍යාකරණ ප්‍රභේද යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට "ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, දොරටු මගක් හෝ වෙනත් නිර්මාණයක් හෝ යම් යටි බිම් මහලක් හෝ වෙනත් යටි බිම් නිර්මාණයක් හෝ යම් ළිඳක්, පොකුණක් හෝ පතල් ළිඳක්" යන යෙදුම් හෝ ඒවායේ ව්‍යාකරණ ප්‍රභේද ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 24අ. අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 24අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

" විධායක ඉංජිනේරුවරයාගේ අවසරය නොමැතිව කිසිම ගොඩනැගිලි ඉදිකිරීමේ අනුමතයක් නොදිය යුතු බව.

24අ. ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, දොරටු මගක් හෝ වෙනත් නිර්මාණයක් හෝ යම් යටි බිම් මහලක් හෝ වෙනත් යටි බිම් නිර්මාණයක් හෝ යම් ළිඳක්, පොකුණක් හෝ පතල් ළිඳක් ඉදිකිරීම හෝ නැවත ඉදිකිරීම සඳහා යම් අධිකාරියක අනුමතය අවශ්‍ය වේ ද ඒ අධිකාරිය විසින්, 24 වන

වගන්තියෙහි සඳහන් ගොඩනැගිලි සීමාව ඇතුළත ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ නැවත ඉදිකිරීම සඳහා අනුමතය දීම, එම ඉදිකිරීම හෝ නැවත ඉදි කිරීම සඳහා ඒ වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයකින් බලය දී ඇත්නම් මිස, නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 25අ. අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"අලුත් පාරක් සඳහා වෙන් කර තැබීමක් ප්‍රකාශයට පත් කිරීම.

25අ. අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍ය වරයා විසින් මිනුම් පිඹුරක නිරූපිත හා ඒ නියම යෙහි ප්‍රමාණවත් විස්තර සහිතව විස්තර කර ඇති භූමි ප්‍රදේශයක්, හඳුනා ගැනීම පහසු කරවීම පිණිස පාරේ දිග සහ පළල නිශ්චය කොට දක්වමින් ඒ භූමි ප්‍රදේශය, ඒ නියමයෙහි සඳහන් යම් පන්තියක ප්‍රසිද්ධ පාරක් ඉදිකිරීම සඳහා ප්‍රයෝජන යට ගැනීමට අදහස් කර ඇති බව ප්‍රකාශයට පත් කළ හැකි ය. ඒ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට, ඒ නියමයෙහි සඳහන් පන්තියට අයත් පාරකට අදාළ ගොඩනැගිලි සීමා ඇතුළත යම් ගොඩ නැගිල්ලක්, මායිම් තාප්පයක්, දොරටු මගක් හෝ වෙනත් නිර්මාණයක් හෝ යම් ළිඳක් පොකුණක් හෝ පතල් ළිඳක් ඉදිකිරීම හෝ යළි ඉදිකිරීම තහනම් කරන මේ ආඥාපනතේ ඇතුළත් විධි විධාන, ඒ නියමයෙහි සඳහන් භූමි ප්‍රදේශයේ පළල කෙරෙහි සහ ඒ හා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"24 වන වගන්තිය උල්ලංඝනය කළ විට අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය.

26. (1) යම් තැනැත්තකු විසින් 24 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් ගොඩ නැගිල්ලක්, මායිම් තාප්පයක්, දොරටු මගක් හෝ වෙනත් නිර්මාණයක් නැතහොත් යම් යටි බිම් මහලක් හෝ වෙනත් යටි බිම් නිර්මාණයක් හෝ යම් ළිඳක්, පොකුණක් හෝ පතල් ළිඳක් ඉදිකරනු ලැබුවහොත් හෝ නැවත ඉදිකරනු ලැබුවහොත් හෝ යම් ගොඩනැගිල්ලකට මායිම් තාප්පයකට, දොරටු මගකට හෝ වෙනත් නිර්මාණයකට නැතහොත්, යම් යටි බිම් මහලකට හෝ වෙනත් යටි බිම් නිර්මාණයකට හෝ යම් ළිඳකට, පොකුණකට හෝ පතල් ළිඳකට යම් කොටසක් එකතු කරනු ලැබුවහොත්, විධායක ඉංජිනේරුවරයා විසින්, ලිඛිත දැන්වීමක් මඟින් ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් ඒ දැන්වීමේ දිනයට දවස් හතකට වඩා

අඩු නොවන යම් දිනයක දී හෝ එදිනට පෙර, ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය, දොරටු මග හෝ වෙනත් නිර්මාණය නැතහොත් යටි බිම් මහල හෝ වෙනත් යටි බිම් නිර්මාණය හෝ ළිඳ, පොකුණ හෝ පතල් ළිඳ කඩා දමන ලෙස හෝ ඉවත් කරන ලෙස ඒ තැනැත්තාට නියම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද, ඒ දැන්වීමෙහි සඳහන් කාලය ඇතුළත, හෝ ඒ කාලය දීර්ඝ කරවා ගැනීම සඳහා කරනු ලැබූ ඉල්ලීමක් මත විධායක ඉංජිනේරුවරයා විසින් ඉඩ දෙනු ලැබිය හැකි දීර්ඝ කරන ලද කාලය ඇතුළත හෝ ඒ දැන්වීමෙහි සඳහන් නියම අනුව ක්‍රියා කිරීම, ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(3) (අ) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක් ප්‍රකාර යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, දොරටු මගක් හෝ වෙනත් නිර්මාණයක් හෝ යම් යටි බිම් මහලක් හෝ වෙනත් යටි බිම් නිර්මාණයක් හෝ යම් ළිඳක්, පොකුණක් හෝ පතල් ළිඳක් ඒ දැන්වීමෙහි සඳහන් කාලය ඇතුළත හෝ විධායක ඉංජිනේරුවරයා විසින් ඉඩ දී තිබිය හැකි යම් දීර්ඝ කරන ලද කාලයක් ඇතුළත හෝ කඩා දමනු නොලැබූ හෝ ඉවත් කරනු නොලැබූ අවස්ථාවක, ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය, දොරටු මග හෝ වෙනත් නිර්මාණය හෝ යටි බිම් මහල හෝ වෙනත් යටි බිම් නිර්මාණය හෝ ළිඳ, පොකුණ හෝ පතල් ළිඳ, කඩා දැමීමට හෝ ඉවත් කිරීමට විධායක ඉංජිනේරුවරයාට බලය දෙන විධානාත්මක ආඥාවක් කරන ලෙස විධායක ඉංජිනේරුවරයා විසින් මහේස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් කළ හැකි අතර, ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය, දොරටු මග හෝ වෙනත් නිර්මාණය හෝ යටි බිම් මහල හෝ වෙනත් යටි බිම් නිර්මාණය හෝ ළිඳ, පොකුණ හෝ පතල් ළිඳ කඩා දමන ලෙස හෝ ඉවත් කරන ලෙස විධායක ඉංජිනේරුවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමය අනුව ක්‍රියා කිරීම පැහැර හැර ඇති තැනැත්තා වෙත දැන්

විමක් නිකුත් කිරීමෙන් පසු ඒ බවට මහේස්ත්‍රාත්වරයා සෑහීමට පත් වන්නේ නම්, මහේස්ත්‍රාත්වරයා විසින් එසේ කඩා දමන ලෙස හෝ ඉවත් කරන ලෙස ආඥා කරනු ලැබිය හැකි ය.

(ආ) ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය, දොරටු මග හෝ වෙනත් නිර්මාණය හෝ යටි බිම් මහල හෝ වෙනත් යටි බිම් නිර්මාණය හෝ ළිඳ, පොකුණ හෝ පතල් ළිඳ කඩා දැමීමට හෝ ඉවත් කිරීමට ඒ තැනැත්තා පොරොන්දු වන්නේ නම්, ඒ තැනැත්තාට ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය, දොරටු මග හෝ වෙනත් නිර්මාණය හෝ යටි බිම් මහල හෝ වෙනත් යටි බිම් නිර්මාණය හෝ ළිඳ, පොකුණ හෝ පතල් ළිඳ කඩා දැමීමේ හෝ ඉවත් කිරීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් යයි මහේස්ත්‍රාත්වරයා සල්පනා කරන මාස දෙකක් නොඉක්මවන යම් කාලයක් සඳහා ඒ ආඥාව ක්‍රියාත්මක වීම කල් තැබීම සුදුසු යයි මහේස්ත්‍රාත්වරයා සල්පනා කරන්නේ නම්, මහේස්ත්‍රාත්වරයා විසින් එසේ කල් තබනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ විධානාත්මක ආඥාවක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ ආඥාව ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය සියලු සහාය විධායක ඉංජිනේරුවරයාට සැපයීම, පොලිස් බලධරයන්ගේ කාර්යය විය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද ආඥාවක් ප්‍රකාර, යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, දොරටු මගක් හෝ වෙනත් නිර්මාණයක් හෝ යම් යටි බිම් මහලක් හෝ වෙනත් යටි බිම් නිර්මාණයක් හෝ යම් ළිඳක්, පොකුණක් හෝ පතල් ළිඳක් කඩා දැමීමෙහි ලා හෝ ඉවත් කිරීමෙහි ලා විධායක ඉංජිනේරුවරයා විසින් දරන ලද සාධාරණ වියදම් කිසිවක් අයකර ගැනීමට ඔහුට හිමිකම ඇත්තේ ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ, "ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ දොරටු මග" යන යෙදුම් හෝ ඒවායේ ව්‍යාකරණ ප්‍රභේද යෙදෙන (එහි (ඇ) ඡේදයෙහි හැර) සෑම තැන කම, ඒ වෙනුවට "ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, දොරටු

මගක් හෝ වෙනත් නිර්මාණයක් හෝ යම් යටි බිම් මහලක් හෝ වෙනත් යටි බිම් නිර්මාණයක් හෝ යම් ළිඳක්, පොකුණක් හෝ පතල් ළිඳක්'' යන යෙදුම් හෝ ඒවායේ ව්‍යාකරණ ප්‍රභේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තියේ "යම් ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ දොරටු මගක'' යන යෙදුම් හෝ ඒවායේ ව්‍යාකරණ ප්‍රභේද යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට "ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක, දොරටු මගක හෝ වෙනත් නිර්මාණයක හෝ යම් යටි බිම් මහලක හෝ වෙනත් යටි බිම් නිර්මාණයක හෝ යම් ළිඳක, පොකුණක හෝ පතල් ළිඳක'' යන යෙදුම් හෝ ඒවායේ ව්‍යාකරණ ප්‍රභේද ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "ගොඩනැගිල්ලක, මායිම තාප්පයක හෝ දොරටු මගක'' යන යෙදුම් හෝ ඒවායේ ව්‍යාකරණ ප්‍රභේද යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට "ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක, දොරටු මගක හෝ වෙනත් නිර්මාණයක හෝ යම් යටි බිම් මහලක හෝ වෙනත් යටි බිම් නිර්මාණයක හෝ යම් ළිඳක, පොකුණක හෝ පතල් ළිඳක'' යන යෙදුම් හෝ ඒවායේ ව්‍යාකරණ ප්‍රභේද ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ—

(i) "ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ දොරටු මගක'' යන යෙදුම් හෝ ඒවායේ ව්‍යාකරණ ප්‍රභේද යෙදෙන (එහි (ii) වන අනුඡේදයේ හැර) සෑම තැනකම ඒ වෙනුවට "ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක, දොරටු මගක හෝ වෙනත් නිර්මාණයක හෝ යටි බිම් මහලක හෝ වෙනත් යටි බිම් නිර්මාණයක හෝ යම් ළිඳක, පොකුණක හෝ පතල් ළිඳක'' යන යෙදුම් හෝ ඒවායේ ව්‍යාකරණ ප්‍රභේද ආදේශ කිරීමෙන් ; සහ

(ii) (ii) වන අනුඡේදයේ "මායිම් තාප්පයක් හෝ දොරටු මගක් සම්බන්ධයෙන් වන විට'' යන යෙදුම වෙනුවට "මායිම් තාප්පයක්, දොරටු මගක් හෝ වෙනත් නිර්මාණයක් හෝ යටි බිම් මහලක් හෝ වෙනත් යටි බිම් නිර්මාණයක් හෝ යම් ළිඳක්, පොකුණක් හෝ පතල් ළිඳක් සම්බන්ධයෙන් වන විට'' යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ දොරටු මගක'' යන යෙදුම වෙනුවට "ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක, දොරටු මගක හෝ වෙනත් නිර්මාණයක හෝ යම් යටි බිම් මහලක හෝ වෙනත් යටි බිම් නිර්මාණයක හෝ යම් ළිඳක, පොකුණක හෝ පතල් ළිඳක'' යන යෙදුම ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි දැක්වෙන "ගොඩනැගිල්ලකට, මායිම් තාප්පයකට හෝ දොරටු මගකට" යන යෙදුම වෙනුවට "ගොඩනැගිල්ලකට, මායිම් තාප්පයකට, දොරටු මගකට හෝ වෙනත් නිර්මාණයකට හෝ යම් යටි බිම් මහලකට හෝ වෙනත් යටි බිම් නිර්මාණයකට හෝ යම් ළිඳකට, පොකුණකට හෝ පතල් ළිඳකට" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය, එහි "යම් මංමාවතකට අවහිරයක් හෝ ප්‍රසර්පණයක් කරන කවර හෝ තැනැත්තකුට වාචිකව හෝ ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, එම අවහිරය හෝ ප්‍රසර්පණය වහාම ඉවත් කරන ලෙස හෝ නතර කරන ලෙස විධායක ඉංජිනේරුවරයා විසින් නියමයක් කිරීම නීත්‍යනුකූල වන්නේ ය. තවද එවැනි නියමයක් කරනු ලැබූ කවර හෝ තැනැත්තකු විසින් සාධාරණ කාලසීමාවක් ඇතුළත ඒ නියමය අනුව ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, හෝ පැහැර හරිනු ලැබුවහොත්" යන වචන වෙනුවට, "යම් මංමාවතකට අවහිරයක් හෝ ප්‍රසර්පණයක් කරන කවර හෝ තැනැත්තකුට, යම් නිශ්චිත දිනයක දී හෝ යම් නිශ්චිත දිනයකට පෙර එම අවහිරය හෝ ප්‍රසර්පණය වහාම ඉවත් කරන ලෙස හෝ නතර කරන ලෙස, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් විධායක ඉංජිනේරුවරයා විසින් නියමයක් කිරීම නීත්‍යනුකූල වන්නේ ය. තවද, එවැනි නියමයක් කරනු ලැබූ කවර වූ හෝ තැනැත්තකු විසින් ඒ නියමය අනුව ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 33අ. අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, **එය එහි 33අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—**

"**විරෝධතා** ඇති වෙතැයි බලාපොරොත්තු වන අවස්ථාවක ගතයුතු ක්‍රියා මාර්ගය.

33අ. මේ ආඥාපනත අදාළ වන කවර හෝ පාරකට, 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ විධිවිධාන අදාළ කර ගැනීමේ කාර්යය සඳහා—

(අ) මේ ආඥාපනතේ 33 වන වගන්තිය යටතේ කරන ලද සෑම ලිඛිත දැනුම් දීමක් ම ඒ පනතේ 3 වන වගන්තිය යටතේ භාර දෙන ලද දැන්වීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) ඒ පනතේ "නියම බලධරයා" යන යෙදුමට අධ්‍යක්ෂවරයා, ප්‍රධාන ඉංජිනේරුවරයා සහ විධායක ඉංජිනේරුවරයා පිළිබඳ සඳහනක් ඇතුළත් වන්නේ යයි සලකනු ලැබිය යුතු ය.

(ඇ) "රජයේ ඉඩම" යන යෙදුමට මේ ආඥා පනත අදාළ වන සෑම පාරක්ම පිළිබඳ සඳහනක් ඇතුළත් වන්නේ යයි සළකනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ යෙදෙන "රුපියල් පණහක්" යන වචන වෙනුවට "රුපියල් පන්දහසක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (8) වන ඡේදයට ඉක්බිතිව ම ඒ වගන්තියේ (9), (10) සහ (11) වන ඡේද වශයෙන් බලපැවැත්විය යුතු, පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(9) යම් බෝක්කුවක, පාලමක හෝ පැති කාණුවක ජලය පහසුවෙන් ගලායාම වැළැක්වෙන, අවහිර වන හෝ බාධාවන පරිදි එහි විවරය මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් වසන නැතහොත් බෝක්කුවක්, පාල මක් හෝ පැති කාණුවක් ඔස්සේ පහසුවෙන් ජලය ගලා යාම ඇණ හිටින හෝ ඊට බාධාවන පරිදි බෝක්කුවක් හෝ පාලමක් අසල පිහිටි පාරක යාබද වූ යම් ඉඩමක නිර්මාණයක් ඉදිකිරීමට, වේල්ලක් තැනීමට හෝ භූමිය ගොඩ කිරීමට සලස්වන හෝ වෙනත් යම් ක්‍රියාවක් කරන කවර හෝ තැනැත්තෙක් ;

(10) බලයක් නොමැතිව යම් මංමාවතක් කැණීමෙන් හෝ යම් මංමාවතකට යාබද හෝ ආසන්න යම් ඉඩමක් කැණීමෙන් හෝ මංමාවතකට හානියක් සිදු කරන හෝ තැනැත්තෙක් ;

(11) ඇදගෙන යාම සඳහා රෝද හෝ ටයර් නොමැත්තා වූ ද, පාරෙහි මතුපිටට එක එල්ලේම ඝර්ෂණය වන්නා වූ ද, වෙනත් උපක්‍රමයක් සහිත වාහනයක් යම් ප්‍රසිද්ධ පාරක් ඔස්සේ හෝ හරහා හෝ පදවන, ඇදගෙන යන හෝ ගෙන යාමට සලස්වන කවර හෝ තැනැත්තෙක්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 35අ සහ 35 ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එහි 35අ සහ 35ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"අඛණ්ඩව කරගෙන යන වැරදි.

35අ. 35 වන වගන්තිය, යටතේ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමෙන් පසුව ද තවදුරටත් ඒ වරද කරගෙන යන්නේ නම්, වරදකරු කරනු ලැබීමෙන් පසුව ඒ වරද කරගෙන යන එක් එක් දවස වෙනුවෙන් රුපියල් දෙසීයයක් නො ඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

මංමාවත් වලට කරන හානි නතර කිරීම.

35ආ. 35 වන වගන්තියේ විධිවිධාන නොතකා 35 වන වගන්තියෙහි සඳහන් යම් වරදක් කරන හෝ යම් වරදක් කර ඇති හෝ තැනැත්තකුට එය වහාම නතර කරන ලෙස වාචිකව හෝ ලියවිල්ලකින් හෝ විධායක ඉංජිනේරුවරයා විසින් නියම කිරීම ද, ඒ නියමයෙහි සඳහන් කාලය ඇතුළත ඒ නියමය අනුව ක්‍රියා කිරීම ඒ නියමය අනුව ක්‍රියා කිරීමට යටත් තැනැත්තා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ නොසලකා හැරියහොත් නැත හොත් ඒ නියමය කළ යුත්තේ කවර තැනැත්තකුට ද යන්න පිළිබඳව යම් සැකයක් වේ නම්, විධායක ඉංජිනේරුවරයා හෝ තත් කාර්යය සඳහා විධායක ඉංජිනේරුවා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ ඒ වරද නතර කිරීම සඳහා අවශ්‍ය විය හැකි තැනැත්තන්, උපකරණ සහ දේවල් රැගෙන යම් නිවාසයකට, ගෙවත්තකට, කොටුවකට හෝ වෙනත් ස්ථානයකට ඇතුළු වී ඒ වරද නතර කිරීම සඳහා අවශ්‍ය **විය හැකි සියලු ක්‍රියා එහිදී කිරීම හෝ කිරීමට** සැලැස්වීම හෝ නීත්‍යානුකූල විය යුතු අතර, ඒ **නතර කිරීමෙහි ලා දරන ලද වියදම 33 වන වගන්** තියේ සඳහන් වියදම් අය කර ගැනීම සඳහා ඒ වගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට විධායක ඉංජිනේරුවරයා විසින් අයකර ගනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ යෙදෙන " කිසිම අවස්ථාවක ඒ කාණුවේ දිගින් අඩි හතරකට අඩු ප්‍රමාණයක් ආවරණය නොවිය යුතු පාලමක් " යන වචන වෙනුවට " කිසිම අවස්ථාවක ඒ කාණුවේ දිගින් මීටර් 2.5 කට අඩු ප්‍රමාණයක් ආවරණය නොවිය යුතු වූ ද, මුහුණත වර්ග සෙන්ටි මීටර් 3720 කට හෝ ලියවිල්ලකින් වූ දැන්වීමක් මඟින් විධායක ඉංජිනේරුවරයා විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් වර්ග ප්‍රමාණයකට නො අඩු විවරයක් සලසා ඇත්තා වූ ද පාලමක් " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

**(2) ඒ වගන්තියේ යෙදෙන " නීත්‍යානුකූල විය** යුතු ය " යන වචන වෙනුවට මෙහි පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

" නීත්‍යානුකූල විය යුතු ය :

එසේ වුවද එවැනි කාණුවක් කැණීමට හෝ හෑරීමට අදහස් කරන බවට විධායක ඉංජිනේරුවරයා විසින් මහජනයාට දැනුම්දීමක් කළ

හෝ තන් පාර අයිනෙන් එවැනි කැණුවක් පැවතුණ නම් අදාළ වන ආකාරයට ම මේ වගන්තියේ ඉහතින් වූ විධාන අදාළ විය යුතු ය. ".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ යෙදෙන "රුපියල් පණහක්" යන වචන වෙනුවට "රුපියල් පන්දහසක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන ඡේදයේ අතුරු විධානයෙහි—

(අ) "රුපියල් එකක" යන වචන හෝ ඒවායේ ව්‍යාකරණ ප්‍රභේද යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට "රුපියල් සැත්තෑපහක්" යන වචන හෝ ඒවායේ ව්‍යාකරණ ප්‍රභේද ආදේශ කිරීමෙන් ; සහ

(ආ) "සත තිහක්' යන වචන වෙනුවට "රුපියල් දහයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (9) වන ඡේදයේ "සහ ඒ කිසිවෙක් ඉවත් කිරීමට නියත වශයෙන් ම අවශ්‍ය වන යම් කාලයක් හැර ඒ කිසිවක් එසේ තිබෙන්නට ඉඩ හරින" යන සියලු වචන ඉවත් කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (14) වන ඡේදයට ඉක්බිතිව ම, ඒ වගන්තියේ (15), (16) සහ (17) වන ඡේද වශයෙන් බල පැවැත්විය යුතු පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

" (15) විධායක ඉංජිනේරුවරයාගේ අවසරය නොමැතිව මංමාවතක යම් සංඥා පුවරුවක්, මාර්ග දර්ශක පුවරුවක් හෝ වෙනත් පුවරුවක් ඉදිකරන කවර හෝ තැනැත්තෙක් ;

(16) නීත්‍යනුකූල බලයක් නොමැතිව, යම් පාරක් හරහා හෝ පාරක අයින ඔස්සේ කඹයක් හෝ කම්බියක් බඳින හෝ බටයක් හෝ පයිප්පයක් එලන කවර හෝ තැනැත්තෙක් ;

(17) නීත්‍යනුකූල බලයක් නොමැතිව, යම් රථයක්, මෝටර් වාහනයක්, කරත්තයක් හෝ වෙනත් දෙයක් හෝ ගවයන් හෝ වෙනත් යම් සතකු යම් පාරක දී සෝදන කවර හෝ තැනැත්තෙක් ; ".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 38 අ සහ 38 ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එහි 38අ සහ 38ආ වගන්ති වශයෙන් බලපැවැත් විය යුතු ය :—

" අඛණ්ඩව කරගෙන යන වැරදි.

38අ. 38 වන වගන්තිය යටතේ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමෙන් පසුව ද, තවදුරටත් ඒ වරද කරගෙන යන්නේ නම්, වරදකරු කරනු ලැබීමෙන් පසුව ඒ වරද කරගෙන යන එක් එක් දවස වෙනුවෙන් රුපියල් දෙසියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

මංමාවත් වලට කරන පීඩා නතර කිරීම.

38ආ. 38 වන වගන්තියේ විධිවිධානයන් නොතකා 38 වන වගන්තියෙහි සඳහන් කර ඇති යම් වරදක් කරන හෝ වරදක් කර ඇති හෝ තැනැත්තකුට එය වහාම නතර කරන ලෙස වාචිකව හෝ ලියවිල්ලකින් හෝ විධායක ඉංජිනේරු වරයා විසින් නියම කිරීම ද, ඒ නියමයෙහි සඳහන් කාලය ඇතුළත ඒ නියමය අනුව ක්‍රියා කිරීමට යටත් තැනැත්තා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ නොසලකා හැරියහොත් නැත හොත් ඒ නියමය කළ යුත්තේ කවර තැනැත්තකුට ද යන්න පිළිබඳව යම් සැකයක් වේ නම්, විධායක ඉංජිනේරුවරයා හෝ යම් සාම නිලධරයකු හෝ විසින්, ඒ පීඩාවට හේතු වූ හෝ දායක වූ යම් සතකු, වාහනයක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් අත්අඩංගුවට ගැනීම සහ ඉවත් කිරීම ද ඇතුළුව, ඒ පීඩාව නතර කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ක්‍රියා කිරීම නීත්‍යනුකූල විය යුතු අතර, ඒ සඳහා දරන්නට සිදු වූ වියදම, වියදම් අයකර ගැනීම සඳහා 33 වන වගන්තියෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට, විධායක ඉංජිනේරු වරයා විසින් අයකර ගනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 39 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 39අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

" නියෝග.

39අ. (1) පහත සඳහන් කාරණා සියල්ලම හෝ ඉන් යම්කිසි කාරණයක් හෝ සඳහා නැත හොත් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින්

නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) යම් ප්‍රසිද්ධ පාරක් හෝ පාලමක් ඉදි කිරීමේ දී අනුකූල විය යුතු පොදු පිරිවිතර ;

(ආ) නගරවලින් විහිදෙන ප්‍රසිද්ධ පාරවල් දෙපස ගොඩනැගිලි ඉදිකිරීම වැළැක් වීම ;

(ඇ) ප්‍රධාන මංමාවත්වලට ප්‍රවේශවීම විධිමත් කිරීම, පාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ;

(ඈ) ප්‍රසිද්ධ පාරක හෝ කිසියම් පන්තියකට අයත් ප්‍රසිද්ධ පාරක පාවිච්චි කිරීමට අවසර දිය හැකි වාහනවල ගෙන යා හැකි උපරිම බර සහ ඒ හා සම්බන්ධ වෙනත් අනුලක්ෂණ.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දින යෙහි හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම, එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබ ඇතැයි සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුයේ යයි සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

(5) කවර හෝ නියෝගයක් උල්ලංඝනය කිරීම මේ ආඥාපනත යටතේ වරදක් වන අතර, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ දැක්වෙන, "ඇල" යන්නෙහි අර්ථකථන යට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

"අධිකාරිය" යන්නෙන් 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන පනතින් පිහිටුවන ලද මාර්ග සංවර්ධන අධිකාරිය අදහස් වේ ;

(2) ඒ වගන්තියේ "මාර්ගයක මධ්‍යය" යන්නෙහි අර්ථකථන යට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

"ප්‍රධාන ඉංජිනේරුවරයා" යන්නෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා වන ප්‍රධාන ඉංජිනේරුවරයා අදහස් වේ ;

(3) ඒ වගන්තියේ "අධ්‍යක්ෂවරයා" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"අධ්‍යක්ෂ" යන්නෙන් මහාමාර්ග අධ්‍යක්ෂවරයා අදහස් වේ ; සහ

(4) ඒ වගන්තියේ සඳහන් "අධිකාරි ඉංජිනේරුවරයා" යන්නෙහි අර්ථකථනය අත්හැරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි අලුත් යෙදුම් ආදේශ කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි—

(අ) "මහාමාර්ග දෙපාර්තමේන්තුව හෝ වැඩ අධ්‍යක්ෂවරයාගේ දෙපාර්තමේන්තුව" යන යෙදුම වෙනුවට "මහාමාර්ග දෙපාර්තමේන්තුව" යන යෙදුම ; සහ

(ආ) "අධිකාරී ඉංජිනේරුවරයා" යන යෙදුම වෙනුවට "ප්‍රධාන ඉංජිනේරුවරයා හෝ විධායක ඉංජිනේරුවරයා" යන යෙදුම්

ආදේශ කරනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි; (විදේශීය) රු. 300 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.